දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.

අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධා-නයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.

තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න




9

සවස පන්තිය ඉවර වූ පසු සුපුරුදු ලෙසින් නිවෙසට නොපැමිණි මා සංවිධානයට බැඳුණු බව කෙසේ හෝ දැනගත් මගේ මාමා, අම්මා, සීයා ඇතුළු සියලු දෙනා කනකපුරම්හි පිහිටි සටන්කාමී සහෝදරියන්ගේ කඳවුර ඉදිරිපිට රැස්ව සිටින බව මට දැනගන්නට ලැබුණි. 'ඔයා ගිහින් එයාලත් එක්ක කතා කරලා එන්න යැයි කඳවුර භාර අක්කා මට පැවසුවාය. එහෙත් මම නොගියෙමි. මවුපිය සෙනෙහසින් මගේ උදාර අරමුණ දුර්වල කර මාව නිවෙසට කැඳවාගෙන යනු ඇතැයි සිතූ මම ඔවුන් ඉදිරියට යාමට බිය වූවෙමි. මම ඔවුන් වෙත ලියූ ලිපිය ඔවුන්ට දෙන මෙන් කඳවුර භාර සහෝදරියගෙන් ඉල්ලා සිටියෙමි. ඇකයේ සහ උරහිසෙහි තබා ගෙන මාව ඇති දැඩි කළ ආදරණීය දෙමව්පියන්ගේ මුහුණු හෝ ඔවුහු මා ඉදිරියේ කඳුළු සලනු දැකීමට ශක්තියක් හෝ ධෛර්යක් හෝ මා තුළ නොවීය. මම හුදකලා ස්ථානයකට ගොස් ඉකිගසා හැඬුවෙමි. උපන්දා සිට මම මගේ පවුලෙන් වෙන්ව සිටියේ නැත. එක්වරම ඔවුන්ව හැරදමා යෑම ගැන සිතා කනගාටුවට පත්වූයෙමි. මා මෙන්ම එතැන සිටි සියලු දෙනාම තම පවුල්වල අයගෙන් වෙන්ව රට වෙනුවෙන් ඉදිරියට පැමිණ ඇති බවට වන හැඟීම මා තුළ උත්සන්න වූයෙන් මම මගේ ශෝකය යටපත් කරගෙන සිත දැඩි කරගත්තෙමි.

පසුදින රාත්‍රියේ වන්නි දිස්ත්‍රික් කාන්තා අංශයේ දේශපාලන කටයුතු භාර සහෝදරිය අප හමුවීමට පැමිණ සිටියාය. 'සංවිධානය යනු දුෂ්කර බවයි-දුෂ්කර බව යනු සංවිධානයයි' යැයි පවසා කතාව ආරම්භ කළ ඇය නවක සටන්කාමී තරුණියන් වූ අප සමඟ කතා බහ කළාය. 'මෙයට පසුව සංවිධානය තමයි ඔබගේ පවුල. මෙහි සිටින අය තමයි ඔබගේ නෑදෑයෝ. අපේ මවත් පියාත් නායකතුමා තමයි. සංවිධානයේ අරගලකරුවන් තුළ තිබිය යුතු පළමු වෙනි ලක්ෂණය තමයි අණට කීකරු වීම.' මේ අයුරින් බොහෝ මූලික කරුණු පිළිබඳව ඇය

## චන්ද්‍රිකා කොටි දේශපාලන අංශයට එක්වෙයි

පැහැදිලි කිරීම් කළාය. එයට පසුව සිදු කෙරුණේ අපේ දැනට භාවිතා කරන නම වෙනුවට සංවිධානය තුළ භාවිත කළ යුතු නම ලබාදීමයි. ඒ අනුව මට ලබාදුන් නම චන්ද්‍රිකා විය. එම මොහොතේ සිට සැබෑ නම භාවිතය නතර කළ යුතු බවත්, අමතක වී හෝ නම භාවිතා කළ හොත් දඬුවමට ලක්වීමට සිදුවන බවටත් දැඩි ලෙස අවධාරණය කළාය. ලුතිතන් කර්නල් චන්ද්‍රන් වන්නි දිස්ත්‍රික්කයේ දේශපාලන භාරකරු ලෙස කටයුතු කර කොක්කාවිල් ප්‍රදේශයේදී හමුදාව සමඟ ඇතිවූ ගැටුමකදී තුවාල ලබා වෛද්‍ය ප්‍රතිකාර සඳහා බෝට්ටුවකින් ඉන්දියාවට ගෙන යන විට මියගිය බව දැනුම් දී තිබිණ. ඔහු මගේ මවගේ පාර්ශ්වයෙන් ඥාතියෙකු වූ හෙයින් මට චන්ද්‍රිකා යන නම ලබා දෙන බව ඇය පැවසුවාය.

නවක සටන්කාමී සහෝදරියෝ දෙසීයකටත් වඩා එහි රැස්ව උන්හ. තව තවත් පිරිස් අලුතෙන් පැමිණෙමින් සිටියහ. එහෙයින් යාපනයේ පුහුණු කඳවුර වෙත යැවීමේ කටයුතු මහත් උනන්දුවකින් සිදු කෙරෙමින් තිබිණ. අලිමංකඩ ප්‍රදේශයෙහි දිගින් දිගටම සටන් ඇවිළෙමින් පැවැති හෙයින් හෙලිකොප්ටර් අහසේ රවුම් ගසමින් නිතර නිතර ප්‍රහාර එල්ල කරමින් තිබුණි. කනකපුරම් කඳවුරේ අඹගස් යට සකස් කර තිබූ '1' හැඩයේ බංකරය තුළ දවස පුරාම රැඳී උන්නෙමු. එහි සිටි පිරිසෙන් දොළොස් දෙනෙකු වෙන්ව තෝරාගෙන අපව කැඳවා මෙසේ පැවසුවාය. 'ඔබලාව තෝරාගෙන තියෙන්නේ දේශපාලන වැඩවලට. සංවිධානයේදී අපි කිසිම කෙනෙකුට තනි තනි පුද්ගලයෝ හැටියට කැමැති කැමති දේවල් කරන්ඩ බැහැ. සංවිධානය පවරන කාර්ය තමයි ඔබලා කරන්න ඕනේ. ඒ නිසා දැන් යවන කණ්ඩායමත් එක්ක ඔයාලව යවන්නේ නෑ. කරන්ඩ ඕනෑ දේ මම පස්සේ කියන්නම්.'

එයට පසුව අපගේ කණ්ඩායම වෙන් කෙරුණි. යාපනයේ වූ කාන්තා සටන්කාමී පුහුණු කඳවුරට පිරිස කැඳවාගෙන යාම සඳහා කුඩා ප්‍රමාණයේ බස් රථ පැමිණ තිබිණ. ඔවුන් සමඟ මා පුහුණු කඳවුරට නොයැවීම මට මහත් බලාපොරොත්තු බිඳ වැටීමක් විය. එහෙත් ඒ බවක් නොපෙන්වා මම නිහඬව උන්නෙමි. පසුදින අප වෙත අලුත් නිල ඇඳුම් ලබාදුන්නේය. පළමු වතාවට නිල ඇඳුම සහ සපත්තු ඇඳ පැළඳ ගත් අවස්ථාවේ ගම්භීර බවක් සහ අභිමානයක් මා තුළට ප්‍රවේශ වූ බව මට දැනුණි. අපේ කණ්ඩායමට අයත් අයව පික් අප් වර්ගයේ වාහනයකට නන්වාගෙන මාංකුලම් කැළෑ ප්‍රදේශයෙහි පිහිටි කඳවුරකට එක්කරගෙන ගියේය. එහි මාසයක පමණ කාලයක් නතරවී මූලික පුහුණුව ලැබුවෙමි. ආයුධ ගලවා නැවත සවිකිරීම, දිවීම, ශාරීරික පුහුණුව යනාදිය සමඟ ජනතාව සමඟ ආශ්‍රය කිරීම සිදුවිය යුත්තේ කෙසේද? සංවිධානයේ ඉතිහාසය, මහාවිරු ඉතිහාසය යනාදියද එහි දී ඉගැන්විය. ඇත්තෙන්ම මෙම පුහුණුවීම් කිසිවක් මට අසීරු නොවීය. උදෑසන හතරට අවදිවීමත් රාත්‍රී දහයට පසුව නින්දට යාමත් සහ මැදියම් රැයේ මුර කිරීමත් ආරම්භයේදී දුෂ්කර විය. එයට පසුව අපගේ කණ්ඩායමට අයත් සාමාජිකාවන් ඒ වන විට විවිධ ප්‍රදේශවල දේශපාලන කටයුතුවල යෙදී සිටි ජ්‍යෙෂ්ඨ සාමාජිකාවන් සමඟ සම්බන්ධ කර යැවීය. ඒ අනුව මාව යැව්වේ වවුනියාව දිස්ත්‍රික්කයේ මකිලංකුලම් නම් ගමටය. විශාල කැළෑවකින් වටවූ නිවෙස් කිහිපයකින් එම ගම වටවී තිබිණ. අපි ගෙයින් ගෙට ගොස් ජනතාව මුණගැසුණෙමු. කාන්තාවන් සහ ළමුන් පිළිබඳ තොරතුරු එක්රැස් කළෙමු. මගේ කාර්යය වූයේ පාපැදියේ තව කෙනෙකු නංවාගෙන යාමත්, අභ්‍යාස පොතක තොරතුරු සටහන් කරගැනීමත්ය. මගේ භාරකාරිය වූ සහෝදරිය බොහෝ දෙනෙකු දන්නා අඳුනන තැනැත්තියක වූවාය. ජනතාව ඇසුරු කිරීම මට මහත් සතුටක් විය. අලුත් ගමක අලුත් මුහුණු අපව දයාබරත්වයෙන් පිළිගන්නා මෙම චාම් මිනිසුන්ගේ මුහුණුවල මම මගේ ඥාතීන්ව දුටුවෙමි.

මැදිවිය පසුකළ මාතාවක් අපේ කඳවුරේ උන්නාය. ඇය තම පුතුන් දෙදෙනාම අරගලයේ දී අහිමි වූ තැනැත්තියකි. එහි වූ ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානයේ වැඩ කළ ඇය සටන්කාමී සහෝදර සහෝදරියන් සමඟ ගොස් දයාබරව ආශ්‍රය කළාය. ඕනෑම දුෂ්කර කාර්යයක් ඇය මැළි නොවී කළාය. ඇයගේ වේගයට සමාන වන ලෙසින් අපේ සටන්කාමී සහෝදරියන්ට පවා පා පැදි පැදිය නොහැකිය. රාත්‍රියෙහි සියලු දෙනා නින්දේ පසුවන විට ''ඈන්ටි සින්දුවක් කියන්නකෝ'' අපි ඉල්ලා සිටින්නෙමු. එවිට ඇය ''පල්ලි සෙල්ලුම් පරුවක් තිලේ පඩෙල් සේර්න්දවර්, අවර් තුල්ලිත් තිරියුම් වයදිනිලේ තුවක්කෙ



36 වන පිටට

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com